# මැතිවරණ කොමිෂන් සභාව
# தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය :011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
General Office
ෆැක්ස්/தொலைநகல்/Fax:011-2868426
*Web: www.elections.gov.lk* *e-mail: info@slelections.gov.lk*

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය(10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய*(10107)*


| | | |
|---|---|---|
| මගේ අංකය : EC/EDR/PRE/2024/6-04B<br>எனது இல. : | ඔබේ අංකය :<br>உமது இல.: | දිනය : 2024.07.26<br>திகதி : |

**චක්‍රලේඛ අංක - 05**

ලේඛනගත තැපෑල

ඉතා වැදගත්

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරුන්/ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්/ සාමාන්‍යාධිකාරීවරුන්

**ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීම - 2024.09.21**
**රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපල මැතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම/ උසස් කිරීම/ මාරු කිරීම සීමා කිරීම**

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා නාමයෝජනා කැඳවීමේ දැන්වීම **2024.07.26** දින ප්‍රසිද්ධ කර ඇත. එදින සිට ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර අවසන් වන තෙක් වූ කාල සීමාව "ඡන්ද විමසීමේ කාල සීමාව" ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 වන ව්‍යවස්ථාවේ සඳහන් වේ. මෙම කාලසීමාව තුළ දී දේශපාලන පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට හේතුවන නැතහොත් වෙනත් පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයකු අගතියට පත්වන ආකාරයේ කටයුතු සඳහා රාජ්‍ය දේපල භාවිතා කිරීමෙන් වැළකිය යුතු බව හා සියලුම දිස්ත්‍රික්කවල රජයේ නිලධරයන්/ සේවකයන් බඳවා ගැනීම් උසස් කිරීම්/ මාරු කිරීම් යනාදී කරුණු සීමා කළ යුතු බව රාජ්‍ය දේපල පාලනය භාරව සිටින අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ප්‍රමුඛ සියලුම නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම් වස් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිඑක්වන ව්‍යවස්ථා අනුව "මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපලක්" යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරාපත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට අයත් ය. එම ව්‍යවස්ථාවේ (ආ) අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන් ක්‍රියාත්මක කිරීමට රජය සතු දේපල භාරව සිටින සියලුම නිලධාරීන් බැඳී සිටී.

03. 2024 වර්ෂයේ පැවැත්වීමට නියමිත ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීම අදාළව රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම, පැමිණිලි/ මැතිවරණ ආරවුල් සම්බන්ධයෙන් සිදුකෙරෙන කාර්යයන්ට අදාළව ඒ ඒ අමාත්‍යාංශ, පළාත් සභා, දෙපාර්තමේන්තු, පළාත් සභා අමාත්‍යාංශ, රාජ්‍ය සංස්ථා හා එවැනි ව්‍යවස්ථාපිත මණ්ඩල යනාදියෙහි සම්බන්ධීකරණ කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්/ ආයතන ප්‍රධානීන් නියෝජනය කිරීම් සඳහා කැබිනට් අමාත්‍යාංශවල දී අතිරේක ලේකම්වරයෙකු හෝ පාලන විෂයභාර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු ද දෙපාර්තමේන්තුවල දී , දෙපාර්තමේන්තුවේ ප්‍රධානී/ අතිරේක ප්‍රධානී හෝ එම මට්ටමේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකු ද, පළාත් සභාවල දී ප්‍රධාන ලේකම්වරයා නියෝජනය සඳහා සුදුසු නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරයෙකු ද, සංස්ථා/ මණ්ඩල යනාදියෙහි පාලන විෂයභාර අතිරේක

සාමාන්‍යාධිකාරීවරයෙකු මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ද 2024.08.04 දිනට පෙර නම් කර එවන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ.

04. ඒ අනුව, කොළඹ දිස්ත්‍රික්කයට අයත් රාජ්‍ය ආයතනවල රාජ්‍ය සම්පත් භාරව/ වගකීම පවරා ඇති/ පැමිණිලි සම්බන්ධ සම්බන්ධීකරණ නිලධාරියා නම් කර මේ සමඟ ඇති ආකෘතියට අනුව සම්පූර්ණ කර කඩිනමින් ෆැක්ස් මඟින් (011-2868153 /011 2877618) හා electionedr@gmail.com ඊ-මේල් ලිපිනයට හෝ තැපෑලෙන් මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකකය, මැතිවරණ කොමිෂන් සභාව, සරණ පාර, රාජගිරිය යන ලිපිනයට එවන ලෙසත් අනෙකුත් දිස්ත්‍රික්කවල රාජ්‍ය ආයතනවල රාජ්‍ය සම්පත් භාරව වගකීම පවරා ඇති පැමිණිලි සම්බන්ධයෙන් නම් කරනු ලබන සම්බන්ධීකරණ නිලධාරියා පිළිබඳ තොරතුරු අදාළ දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලයේ නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත යැවීමට කටයුතු කරන ලෙසත් මෙයින් දන්වා සිටිනු ලැබේ.

05. (i) මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජය සතු මෝටර් රථ, ජීප් රථ ආදී සියලුම වාහන සහ හෙලිකොප්ටර් සහ ගුවන් යානා යොදවා ගන්නා බවට පසුගිය මැතිවරණ අවස්ථාවල දී ද මෙම කොමිෂන් සභාවට පැමිණිලි ලැබී ඇත. එබැවින් රජයේ වාහන භාරව සිටින සියලු නිලධාරීන් එම වාහන යම් දේශපාලන පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයකුගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා භාවිතා නොවන ආකාරයට මැතිවරණ කාල සීමාව තුළ වාහන සංචිතය නඩත්තු කිරීම විශේෂ අවධානයකින් යුතුව සිදු කළ යුතු බව අවධාරණය කරමි. නිලධාරීන්ට වෙන් කර ඇති (Assigned Vehicles) රජය සතු වාහන සහ කුලියට ලබාගෙන රාජකාරි කටයුතු සඳහා යොදවන වාහන ද මීට ඇතුළත් වන බව සැලකිය යුතු ය. මෙම කාල සීමාව තුළ දී නිලධාරීන්ට වෙන්කර ඇති (Assigned Vehicles) වාහන හැර විශේෂයෙන්ම සංචිතවලට අනුයුක්ත වාහන සහ අනිකුත් වාහන සඳහා ධාවන සටහන් නියමාකාරයෙන් පවත්වා ගත යුතු අතර, මෙම ධාවන සටහන් මාණ්ඩලික නිලධාරියකු විසින් දිනපතා පරීක්ෂා කර එම වාහන මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට නොයෙදෙන බවට සෑහීමකට පත්විය යුතු ය. රාජකාරි කටයුතු සඳහා යෙදවූ බව ව්‍යාජ සටහන් යොදා රජයේ වාහන දේශපාලනමය ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් යොදා තිබූ අවස්ථා පසුගිය ඡන්ද විමසීම්වල දී වාර්තා වී ඇති හෙයින් එවැනි ව්‍යාජ කරුණු සඳහා රජයේ වාහන නොයෙදවීමට ඒවායේ පාලනය භාර නිලධාරීන් වගබලා ගත යුතුවේ.

(ii) කිසිදු වාහනයකට මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් වෙන් කරනු ලැබූ අනන්‍ය ලියාපදිංචි අංකය රහිතව ධාවනය කළ නොහැකි බැවින් කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට, ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හෝ වෙනත් කිසිවකුට අදාළ නියමිත ලියාපදිංචි අංකය රහිතව රජයේ හෝ රාජ්‍ය ආයතනවල වාහන භාවිතා කළ නොහැකිය. එබැවින් සියලු දෙපාර්තමේන්තු රාජ්‍ය ආයතන සතු වාහන ගරාජ අංකවලින් (ව්‍යාජ අංකවලින්) ධාවනයේ නොයෙදෙන බවට අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිසැක විය යුතු ය.

06. රජයේ කාර්යාල, ගොඩනැගිලි, පාසැල්, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය ද රජයේ සම්පත් වේ. එම නිසා එම ගොඩනැගිලි දේශපාලන රැස්වීම්, සාකච්ඡා ආදියට යොදවා ගැනීම ද නොකළ යුතු ය. මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදී සිටින පුද්ගලයින්ට රජය සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන ආදිය ද නොමිලේ ලබාදීම සම්පූර්ණයෙන්ම තහනම් බව ද සැලකිය යුතු ය. තවද සියලු පළාත්වල පිහිටි රජයේ හෝ රාජ්‍ය ආයතන සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන යනාදිය කිසිදු දේශපාලඥයකුට, නිලධරයකුට, වෙනත් පුද්ගලයෙකුට ඡන්ද විමසීම් කාලසීමාව තුළ පූර්ණකාලීනව වෙන් කර දීමෙන් වැළකිය යුතු ය. එමෙන්ම එවැනි ස්ථානවල නවාතැන් ගන්නා පුද්ගලයින්ට දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීමේ කටයුතුවල නිරත වීමට ඉඩ නොදිය යුතු ය. රජය සතු ගොඩනැගිලි සහ ඒවා පිහිටි භූමිවල දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයින්ගේ මැතිවරණ ප්‍රචාරක දැන්වීම්, පෝස්ටර් කටවුට් ආදිය ප්‍රදර්ශනය සඳහා භාවිතා කිරීමට ද ඉඩ නොදිය යුතු ය.

07. (i) ඡන්ද විමසීම් කාලය තුළ රජයේ මුදල් වැය කරමින් පවත්වනු ලබන විවිධ ආකාරයේ ජංගම සේවා, ප්‍රදර්ශන, විවෘත කිරීම් වැනි උත්සව ආදිය දේශපාලන අංශවලට සම්බන්ධ පුද්ගලයින්ගේ සහභාගීත්වයෙන් සිදුකෙරෙන අතර එම අවස්ථාවල දී ඡන්ද විමසීමට අදාළව නොයෙකුත් මතිමතාන්තර ඔවුන් වෙතින් ප්‍රකාශ වීමට ඉඩ ඇත. එබඳු ප්‍රකාශයක් ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වයට ද අනිසි ලෙස බලපානු ඇත. මෙවැනි උත්සව පැවැත්වීමෙන් යම් පක්ෂයක්/ කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමට හෝ වෙනත් පක්ෂයක්/ කණ්ඩායමක්/ අපේක්ෂකයකුට අගතියක් වන බවට පැමිණිලි ලැබිය හැකි හෙයින් මෙම ඡන්ද විමසීම් කාලය තුළ එබඳු උත්සව අවස්ථා පැවැත්වීමෙන් වැළකී සිටීම යෝග්‍ය බව පෙන්වා දෙනු කැමැත්තෙමි. මහජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අත්‍යාවශ්‍ය ජංගම සේවා මෙම ඡන්ද විමසීම් කාලසීමාව තුළ පැවැත්වීමට ඡන්ද විමසීමට අදාළ නාමයෝජනා කැඳවීමේ දැන්වීම නිකුත් කිරීමට පෙර දින නියම කරගෙන ඇත්නම් එවැනි අවස්ථා පිළිබඳව වහාම මැතිවරණ කොමිෂන් සභාව වෙත දැන්වීමට ක්‍රියා කළ යුතු වේ. එවිට ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන්

උපදෙස් ලබා දෙනු ඇත. එසේ වුවත් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් හෝ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ජංගම සේවා සඳහා මෙම සීමා කිරීම බලනොපැවැත්වේ. මෙවැනි ජංගම සේවා නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පමණක් පැවැත්වීමට වගබලා ගත යුතු බව අවධාරණය කරනු ලැබේ.

(ii) මෙම කාලසීමාව තුළ දී රජයේ ඉඩම් බෙදා දීම්, රජයේ ඉඩම් හිමිකම් ඔප්පු හෝ නිවාස අයිතිය පැවරීමේ ඔප්පු ප්‍රදානය කිරීම්, වැව්ලි කර්මාන්ත සඳහා හෝ වගා කටයුතු සඳහා සහල් ඇතුළු ආහාර ද්‍රව්‍ය, මුදල් හා විවිධ සහනාධාර, පොහොර, කෘෂි උපකරණ, ක්‍රීඩා භාණ්ඩ, ස්වයං රැකියා සඳහා උපකරණ, පාපැදි, සූර්ය බල විදුලි පහන්, නිවාස ඉදිකිරීම් සඳහා වූ ගොඩනැගිලි ද්‍රව්‍ය යනාදිය බෙදාහැරීමේ ව්‍යාපෘති හා නිවාස ණය නිකුත් කිරීම්/ වන්දි මුදල් ප්‍රදානය කිරීම් වැනි වැඩසටහන් අත්හිටුවිය යුතු ය. එසේ ලබා දෙන බවට රාජ්‍ය නිලධාරීන් විසින් නිවේදන නිකුත් කර ඒ සඳහා ලැයිස්තු සකස් කිරීම ද මෙම කාලසීමාව තුළ නොකළ යුතු ය. මක්නිසාදයත්, එවැනි කාර්යයන් මගින් ඡන්දදායකයන්ට සංග්‍රහ කිරීමේ වරද සිදු කරන බවට පැමිණිලි ලැබෙන හෙයින් හා මෙවැනි ව්‍යාපෘති හා වැඩසටහන් මගින් දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් ප්‍රවර්ධනය සිදු කරන බවට පැමිණිලි ලැබෙන හෙයිනි. තවද, නිවාස ණය ආධාර ලබා දීම සඳහා ආකෘති බෙදා හැරීම, ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා දීම සඳහා ආකෘති බෙදා හැරීම වැනි කටයුතු සිදු කිරීම ද අත්හිටුවිය යුතු ය. එසේ වුව ද කල්තැබිය නොහැකි හදිසි ව්‍යාපෘති/ වැඩසටහන් සඳහා දැනටමත් දින නියම කර තිබේ නම් හෝ හදිසි විශේෂිත අවශ්‍යතාවක් ඇති වුවහොත් හෝ ඒ සම්බන්ධයෙන් මා වෙත දන්වා එවිය යුතු ය. එවිට ඒ පිළිබඳව සුදුසු උපදෙස් නිකුත් කරනු ලැබෙනු ඇත. එවැනි ව්‍යාපෘති/ වැඩසටහන් වුවද ක්‍රියාත්මක කළ යුත්තේ කිසිඳු දේශපාලන පක්ෂයක/ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට විශේෂ වාසියක් (හෝ අගතියක්) නොවන පරිදි වන බවත්, ඒ සඳහා නිලධාරීන් පමණක් සහභාගී විය යුතු බවත් සැලකිය යුතු ය.

08. (i) මෙම ඡන්ද විමසීමට අදාළව රජයේ හෝ රාජ්‍ය සංස්ථා ඇතුළු ආයතනවල නිලධාරීන් කිසිවකුට කාර්යාල වේලාව තුළ හෝ කාර්යාල දිනවල රාජකාරී නිවාඩු ලබාගෙන හෝ කිසියම් පක්ෂයක්/ කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීම සඳහා හෝ කිසියම් පක්ෂයකට / කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට එරෙහිව ක්‍රියා කිරීම සඳහා අවකාශ නොදිය යුතු අතර එසේ ක්‍රියා කරන නිලධාරීන්/ සේවකයන් පිළිබඳව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුවේ.

(ii) අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුලු දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ මාණ්ඩලික නිලධාරීන්, සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල මාණ්ඩලික නිලධාරීන්, ග්‍රාමනිලධාරීන්/ වන නිලධාරීන් වැනි සාම නිලධාරීන් හා ආරක්ෂක අංශවල සාමාජිකයින් ස්වකීය කාර්යාල වේලාවල තුළ පමණක් නොව කාර්යාල වේලාවෙන් බැහැරව මෙන්ම නිවාඩු දිනවලදී වුවද වක්‍රව හෝ ඍජුව හෝ කිසිදු දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන ආකාරයේ නැතහොත් අගතියට පත්වන ආකාරයේ ක්‍රියාකාරකම්වලට සහභාගී වීමෙන් හෝ ඒවාට අනුබල දීමෙන් හෝ වැළකී සිටිය යුතු ය. එනම්, දේශපාලන අයිතිවාසිකම් රහිත සියලුම නිලධාරීන්ට දේශපාලනමය කටයුතුවල යෙදීමට අවසර නොමැති බවට වූ නියමය ඉතා තදින් බලාත්මක කළ යුතු ය.

(iii) තවද සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂවරුන් ද මෙම ඡන්ද විමසීම් කාල සීමාව තුළදී කිසිදු දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනයට හෝ අගතියට පත්වන ආකාරයේ ක්‍රියාකාරකම්වල යෙදීමෙන් වැළකී සිටිය යුතු වේ.

(iv) දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ නිලධරයෙකු තම පෞද්ගලික සමාජ ජාල ගිණුමක් හෝ වෙනත් ගිණුමක් භාවිතාකරමින් යම් දේශපාලන පක්ෂයක් හෝ අපේක්සකයෙකු ප්‍රවර්ධනයට හෝ අගතියට හේතුවන කිසිඳු ප්‍රචාරණයක් හෝ ප්‍රකාශයක් සිදු කිරීම වරදක් වන්නේය. දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධරයෙකු වුවද රාජකාරී වේලාව තුළ රජයේ සම්පත් භාවිත කරමින් එවැනි ප්‍රචාරණයේ නිරත වීම වරදක්වේ.

09. (i) ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ විද්‍යාලයන්හි ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන්ගේ සාමාන්‍ය ස්ථාන මාරුවීම් ඡන්ද විමසීම් පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර අවසන් වන දින දක්වා අත්හිටුවිය යුතු අතර, ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවනු නොලබන රජයේ හෝ රාජ්‍ය සංස්ථා නිලධාරීන් හෝ ඡන්ද විමසීම් කාල සීමාව තුළ ස්ථාන මාරු කිරීමේ දී දේශපාලන හේතූන් මත එකී ස්ථාන මාරුවීම් සිදු කරනු ලැබූ බවට පැමිණිලි නොලැබෙන සේ අදාළ ස්ථාන මාරු කිරීම් සිදුකිරීමට සියලුම බලධාරීන් කටයුතු කිරීම කළ යුතුවේ.

(ii) ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී රාජ්‍ය නිලධාරීන් අත්‍යාවශ්‍ය හේතූන් මත උදාහරණ වශයෙන් ශිෂ්‍යත්ව, උසස් අධ්‍යාපනය, වෛද්‍ය ප්‍රතිකාර, වන්දනා ගමන් යනාදිය සඳහා සිදු කෙරෙන විදේශ ගමන් සීමා කිරීමට අපේක්ෂා නොකෙරේ. එබැවින් එවැනි අවශ්‍යතා සඳහා නිලධාරී විදේශ ගත වීම් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙතින් පූර්ව අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවක් නැත. එසේ වුවද නිලධාරීන් සමූහ වශයෙන් මෙම කාලය තුළ විදේශගත වන්නේ නම් ඒ සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.

තවද, එසේ වුවද ඉතා හදිසි හා කල් තැබිය නොහැකි හේතු නිසා විදේශගතවීම් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අනුමැතිය දීම පිළිබඳව සලකා බලනු ලබන හෙයින් එවැනි අවස්ථා සම්බන්ධයෙන් වූ ඉල්ලීම් කල්වේලා ඇතිව ඉදිරිපත් කිරීම සිදුකළ යුතු ය.

(iii) ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් ප්‍රකාශයට පත් කිරීමට පෙර ආරම්භ කර තිබූ නිලධාරීන් බඳවා ගැනීම්/ උසස් කිරීම්වලට අදාළ දීප ව්‍යාප්ත වැඩපිළිවෙලක් කල්දැමීමකින් තොරව ක්‍රියාත්මක කළ යුතුයයි අමාත්‍යාංශ ලේකම්වරයා අපේක්ෂා කරන විට දී හා සමස්ථ දිවයිනටම බලපාන පරිදි රාජ්‍ය සේවයට හෝ රාජ්‍ය ආයතනවලට අදාළ වන විධිමත්ව, දේශපාලන මැදිහත්වීම්වලින් තොරව සිදු කෙරෙන වෙනත් බඳවා ගැනීම්/ උසස් කිරීම් සඳහා මෙම චක්‍රලේඛය අදාළ නොවේ.

(iv) තවද, කිසියම් විශේෂිත අත්‍යාවශ්‍ය කරුණක් හේතුවෙන් (එනම් විනය ක්‍රියාමාර්ග, නිලධාරියාගේ ඉල්ලීම මත සානුකම්පිතව ක්‍රියාකිරීමට සිදුවීම, යම්කිසි පාඨශාලාවකට අත්‍යාවශ්‍ය ගුරුවරුන් ලබාදීම වැනි කරුණු හේතුවෙන්) නිලධාරීන්/ ගුරුවරුන්/ විදුහල්පතිවරුන් ස්ථාන මාරුකිරීමට සිදුවන විට එම මාරුකිරීම් දේශපාලනමය සිද්ධීන් නිසා කරනු ලබන මාරුවීම් නොවන බවට සනාථ කළ හැකි නම් නැතහොත් ඒ සම්බන්ධයෙන් පැමිණිලි/ චෝදනා නොලැබේ නම් එවැනි මාරුවීම් සම්බන්ධයෙන් මැතිවරණ මහලේකම් කාර්යාලය දැනුවත් කරනු ලැබූ පසු ඒ සඳහා අනුමැතිය ලබාදිය හැකිය.

(v) සනීපාරක්ෂක කටයුතු හා කැළිකසල ඉවත් කිරීම් යනාදී අත්‍යාවශ්‍ය කාර්යයන් බිඳ වැටීම වැළැක්වීම සඳහා හදිසි බඳවා ගැනීම් කිරීමට වුවද සවිස්තර කරුණු දන්වා මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු ය. මෙම සියලුම කරුණු විනිවිද බවින් යුතු වීමත්, තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ අදාළ සියලු කරුණු ඕනෑම පුරවැසියෙකුට ලබා ගැනීමට හැකි බවත් ජනමාධ්‍ය, සිවිල් සංවිධාන හා ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂ මෙවැනි කරුණු කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වන බවත් සැම විටම සිහිතබා ගත යුතු ය.

(vi) තවද, ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා වන ගැසට් නිවේදනය 2024.07.26 දින නිකුත් කර ඇති බැවින් එම දිනයට පෙර දින යොදා පෙරදාතම් කොට පත්වීම් ලිපි/ උසස් කිරීම් සහ බඳවා ගැනීම් සඳහා වන අයදුම්පත් කැඳවීම් සිදුවන බවට මැතිවරණ කොමිෂන් සභාවට පැමිණිලි ලැබී ඇති බැවින් එවැනි ආකාරයේ කාර්යයන් සිදු කිරීම කිසිසේත්ම නොකළ යුතු බව දැඩි ලෙසම අවධාරණය කරනු ලැබේ.

10. **රාජ්‍ය දේපල විශේෂයෙන්ම රජයේ ආයතන හා නිලධාරීන් ඡන්ද විමසීමට අදාළ පක්ෂ / කණ්ඩායම් හෝ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යෙදවීමේ ප්‍රවණතාවක් ඇති බවට පසුගිය ඡන්ද විමසීම්වල දී පැමිණිලි ලද හෙයින් එවැනි අකටයුතු සඳහා කිසිදු අවකාශයක් නොදිය යුතු ය. පසුගිය ඡන්ද විමසීම්වලදී ලද පැමිණිලිවලින් වාර්තා වූ පරිදි හදිසි රාජකාරි කටයුතු හෝ විශේෂ සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම යනාදී කරුණු ඉදිරිපත් කරමින් පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය කිරීම සඳහා (නැතහොත් අගතියට පත් කිරීම සඳහා) රජයේ/ රාජ්‍ය ආයතනවල නිලධාරීන් හා රජයේ/ රාජ්‍ය ආයතන සතු හෝ කුලියට ගත් වාහන දේශපාලන අවශ්‍යතා සඳහා වෙනත් කාර්යාලවලට අනුයුක්ත කිරීම් වැනි අකටයුතු සිදු කිරීමට කිසිදු නිලධරයකුට ඉඩ නොදිය යුතු බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම ඡන්ද විමසීම් කාලය තුළ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද කල් තැබිය යුතු වේ.**

11. මෙම ඡන්ද විමසීමේ දී අපේක්ෂකයන් හෝ ඔවුන් ඉදිරිපත් වී ඇති දේශපාලන පක්ෂයක් ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය දේපල භාවිතා කිරීම වළක්වාලමින් කර ඇති මෙම තහනම කිසිදු ලිහිල් කිරීමකින් තොරව තදින්ම ක්‍රියාත්මක කළ යුතු ය. තවද, ඒ ඒ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා වෙනත් ආයතනවල ප්‍රධානීන්ට ද මේ පිළිබඳව උපදෙස් දීමට ක්‍රියා කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. එමෙන්ම එම සියලු ආයතනවල නිලධාරීන් මෙම උපදෙස් හා නියමයන්ට අනුකූලව ක්‍රියාකරන බවට අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් නිසැකවීම අත්‍යවශ්‍යය.

12. ඡන්ද විමසීමට අදාළ සියලුම නීති බලාත්මක කිරීමට, සුරක්ෂිත කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට සහාය දැක්වීම අදාළ නීති බලාත්මක කිරීම භාරව සිටින සියලුම රජයේ බලධරයන්ගේ කාර්යය විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ <u>104ආ (2) ව්‍යවස්ථාවෙහි</u> කර ඇති සඳහන පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය බව කාරුණිකව දන්වා සිටිනු කැමැත්තෙමි.

13. මෙම චක්‍රලේඛ ලිපියේ සඳහන් කරුණු පිළිබඳව අමාත්‍යවරු සහ නියෝජ්‍ය ඇමතිවරුන් සහ අමාත්‍ය කාර්ය මණ්ඩල දැනුවත් කිරීම අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පැවරෙන බව ද පළාත් ආණ්ඩුකාරවරුන් දැනුම්වත් කිරීමේ වගකීම ආණ්ඩුකාරවර ලේකම්වරයා වෙත පැවරෙන බව ද, ප්‍රධාන ලේකම්වරයා හා අදාළ පළාත් සභා අමාත්‍ය ලේකම්වරුන් ද අදාළ වන පරිදි ආණ්ඩුකාරවරුන් දැනුම්වත් කළ යුතු ය.

14. එමෙන්ම අදාළ වන විට කොමිෂන් සභාවල ලේකම්වරුන් එකී කොමිෂන් සභාවල සභාපතිවරුන් හා සාමාජිකයන් චක්‍රලේඛය පිළිබඳව දැනුවත් කිරීමට ක්‍රියා කළ යුතුවේ.

15. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරුණුවලට අමතරව, ඔබේ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නැතහොත් ගණන් දීමේ නිලධාරී වශයෙන් ද රජය සතු දේපල අනිසි ලෙස පරිහරණය කිරීම වැළැක්වීම ද අදාළ නිලධාරීන්ගේ වගකීමක් බව මෙහි ලා සඳහන් කරමි.

16. මෙම ලිපියේ සඳහන් කරුණු පිළිබඳව සුපුරුදු පරිදි පිළිගත් දේශපාලන පක්ෂ, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන දැනුවත් කරනු ලබනු ඇති අතර "මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන්, පොලිස් නිලධාරීන්, දේශපාලන පක්ෂ නියෝජිතයින් හා මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයින්ගෙන් සමන්විත ඡන්ද විමසීම් සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳව ක්‍රියාකිරීමේ මධ්‍යස්ථානය" විසින් මෙහි සඳහන් කරුණුවලට අදාළව ලැබෙන පැමිණිලි ගැන විමර්ශනය කරනු ඇති බවත් ඡන්ද පෙත්සම්වල දී සහ අගතියට පත් පාර්ශ්ව විසින් ගනු ලබන වෙනත් අධිකරණ ක්‍රියාමාර්ගවල දී මෙහි සඳහන් උපදෙස්වලට අනුකූල නොවන ක්‍රියා පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට අවකාශ ඇති බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

17. මැතිවරණ කොමිෂන් සභාවේ මෙම විධානවලට අනුකූල වීමට අපොහොසත් වීම වරදක් වන අතර ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (ඉ) ව්‍යවස්ථාව ප්‍රකාරව එවැනි වරදකට වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයක් හෝ අවුරුදු තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හෝ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු බව අවධාරණය කරමි.

18. මෙම ලිපියට අමුණා ඇති ආකෘතිය **(EC/EDR/PRE/2024/06-04B)** සම්පූර්ණ කර එවීමෙන් මෙම ලිපිය ලැබුණු බව සහ ඒ අනුව කටයුතු කිරීමට සටහන් කර ගත් බව සනාථ කරන මෙන් කාරුණිකව දන්වමි. තවද ඔබ ආයතනය සතුව ඇති වාහන භාරව කටයුතු කරන නිලධාරීන් පිළිබඳ විස්තර ද එහි පහතින් ඇති කොටසේ සඳහන් කර එවන මෙන් කාරුණිකව දන්වමි.

19. මෙම උපදෙස්/ නියෝග මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත නිකුත් කරනු ලැබේ.

**සමන් ශ්‍රී රත්නායක**
**මැතිවරණ කොමසාරිස් ජනරාල්**

පිටපත් -

1. ජනාධිපති ලේකම්, - දැනගැනීම පිණිස
2. අග්‍රාමාත්‍ය ලේකම්/ අමාත්‍ය මණ්ඩල ලේකම් - දැනගැනීම පිණිස
3. විගණකාධිපති , විගණකාධිපති දෙපාර්තමේන්තුව - දැනගැනීම පිණිස
4. අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව - දැනගැනීම පිණිස
5. සියලුම අමාත්‍යාංශ අතිරේක ලේකම්වරුන් - දැන ගැනීම පිණිස හා ක්‍රියා කිරීම සඳහා
6. ත්‍රිවිධ හමුදාපතිවරුන්/ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
   - දැනගැනීම පිණිස සහ අවශ්‍ය කටයුතු සඳහා
7. පොලිස්පති - දැන ගැනීම පිණිස සහ ඡන්ද විමසීම් නීති බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම් වස්.
8. සියලුම තේරීම්භාර නිලධාරීන් වෙත - මෙම ලිපියේ සඳහන් උපදෙස් හා නියමයන්ට එරෙහිව සිදුවන කටයුතු පිළිබඳව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් නොපමාව මා වෙත වාර්තා කිරීම පිණිස හා එවැනි කටයුතු වළක්වාලීමට අවශ්‍ය පියවර ගැනීම පිණිස
9. දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත - දැන ගැනීම සඳහා සහ ඔබ දිස්ත්‍රික්කයේ සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන්, සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් සහ නාගරික කොමසාරිස්වරුන්, නගර සභා සහ ප්‍රාදේශීය සභා ලේකම්වරුන් වෙත මෙම ලිපියේ පිටපතක් යැවීම සඳහා සහ එහි සඳහන් ආකාරයට කටයුතු කරන ලෙස දැන්වීම පිණිස
10. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්

EC/EDR/PRE/2024/6-04B

**චක්‍රලේඛ ලද බව දැන්වීමේ ආකෘතිය**

(මෙම ආකෘතිය ආයතනයේ නිල ලිපි ශීර්ෂයක සකස් කර එවීමට කාරුණික වන්නේ නම් මැනවි. අමාත්‍යාංශවල දී මෙම සහතිකය ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකු නැතිහොත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකු විසින් ද දෙපාර්තමේන්තුවක් වන විට දී දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ අතිරේක නැතහොත් නියෝජ්‍ය ප්‍රධානියකු විසින් ද, සංස්ථාවක් හෝ මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට දී සාමාන්‍යාධිකාරී/ අතිරේක සාමාන්‍යාධිකාරී හෝ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරක් හෝ ඒ හා සමාන තනතුරක් දරන අයකු විසින් ද අත්සන් කර එවිය යුතුය.)

*මෙම ආකෘතිය මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන්ද ලබා ගත හැකිය. (www.elections.gov.lk)*

---

මගේ අංකය :

ඔබේ අංකය : EC/EDR/PRE/2024/6-04B

කාර්යාලයීය ලිපිනය

.............................................................................

.............................................................................

දිනය - 2024 ………………..

**කාර්යාංශ ප්‍රධානී**
**මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානය/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය**
**මැතිවරණ කොමිෂන් සභාව/..............................................................**
**මැතිවරණ මහලේකම් කාර්යාලය**
**සරණ මාවත, රාජගිරිය**

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් - 2024
රජයේ සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් එවන 2024.07.26 දිනැති අංක EC/EDR/PRE/2024/-6-4B දරන ලිපිය ලද බවත්, එහි සඳහන් පරිදි රාජ්‍ය සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා නිසි පරිදි කටයුතු කිරීමට සටහන් කරගත් බවත්, එහි ඇති උපදෙස් අනුව ක්‍රියා කිරීමට මා යටතේ ඇති සියලුම සංස්ථා සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුලු සියලුම මාණ්ඩලික නිලධාරීන්ට දන්වා යවන බවත් මෙයින් දන්වා සිටිමි.

02. මෙම අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ සංස්ථාව/ අධිකාරිය සතුව ඇති වාහන පරිහරණය කිරීම/ මුදාහැරීම සම්බන්ධව කටයුතු කරන නිලධාරියාගේ/ නිලධාරීන්ගේ විස්තර මෙහි පහත සඳහන් කරමි.

නම : ........................................................................................................

තනතුර: ......................................................................................................

කාර්යාල ලිපිනය : ........................................................................................

දුරකථන අංක : (i) කාර්යාලය : ..........................................................
(ii) නිවස : ..........................................................
(iii) ජංගම : ..........................................................
(iv) ඉ-තැපැල : ..........................................................

..........................................................
අත්සන

..........................................................
නම සහ තනතුර